**ශීර්ෂය 194 - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජූනි 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) ) ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 14 දින ගණන්දීමේ නිලධාරිට වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිලිබඳව මා විසින් කර තිබුණු පහත නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ 2.2 ඡේදය | වර්ෂ 02 සිට 05 දක්වා වූ කාලයට අදාළ, රු. 1,949,331 ක තැන්පතු 09 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය පිහිටි ඉඩම, ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් 03 ක් සහ ක්‍රීඩා විද්‍යා ආයතනය හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය ස්ථාපිත කර ඇති ඉඩම් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අමාත්‍යාංශ ගොඩනැගිල්ල පිහිටි ඉඩම මේ වන විට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධීකරණය වී පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.<br>ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ගොඩනැගිල්ල පිහිටි ඉඩම සහ ක්‍රීඩා වෛද්‍ය ආයතන පිහිටි ගොඩනැගිල්ල සහිත ඉඩම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව සතු ඉඩමක් වේ.<br>ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අයත් ඉඩම් මැණුම් කටයුතු අවසන් කර පිඹුරු සකස්කර පරික්ෂා කිරීම සඳහා රත්නපුර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කර ඇත. | වත්කම් නිත්‍යානුකූලව පවරා ගෙන ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ ඇති දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය, ජාතික ක්‍රිඩා සභාවට අයත් ඉඩම හා ගොඩනැගිල්ල, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සතු ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ නායකත්ව සංවර්ධන ජාතික | දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ස්ථාපිත ඉඩම අමාත්‍යාංශය වෙත පැවරීමට අවශ්‍ය මැණුම් කටයුතු සිදු කරමින් පවතින අතර එම වාර්තාව ලද පසු පැවරීමේ නිර්දේශ ඉදිරිපත් කරන බව හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.<br>ජාතික ක්‍රීඩා සභාව පිහිටා ඇති | වත්කම් නිත්‍යානුකූලව පවරා ගෙන ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථානය සතු ගොඩනැගිලිවල පවතින තවදුරටත් වාර්තා කල යුතු මූල්‍ය නොවන වත්කම්වල තක්සේරු වටිනාකම 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 8.2 ප්‍රකාරව ගිණුම්ගත කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | ගොඩනැඟිල්ල හා ඉඩම, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වන අතර එම ඉඩම හා ගොඩනැඟිලි මෙතෙක් තක්සේරු කර නොමැත.<br>කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය සතු ඉඩම්, ගොඩනැඟිලි තක්සේරු කර ගැනීමට අදාල කටයුතු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට කටයුතු කරන ලද අතර, එම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීම සඳහා අදාල කටයුතු සිදු කරමින් පවති.<br>නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානය සතු ගොඩනැඟිලි තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව ඉඩමේ පිඹුර හා සැලැස්ම අවශ්‍ය බව දැනුම් දී ඇති බැවින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් අදාල ලේඛන ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගනු ලැබේ. | |
| (ඇ) | අමාත්‍යාංශයේ සංචිත රාජකාරී සඳහා යොදවා ඇති පිරිවැය එකතුව රු. මිලියන 11 ක් වූ වාහන 02 ක් ජනාධිපති කාර්යාලය වෙතින් අයිතිය පවරාගෙන, එම වත්කම් වටිනාකම අමාත්‍යාංශයේ ගිණුම්වල දක්වා නොතිබුණි. | වාහන - PB -9860 හා PE -7746 අංක දරණ ඩබල් කැබ් රථ දෙක මෙම අමාත්‍යාංශය වෙත පවරාදීමේ කටයුතු කඩිනමින් කරන ලෙසට දන්වමින් ජනාධිපති කාර්යාලය වෙත ලිපියක් යොමු කර ඇත. | වත්කම් නිත්‍යානුකූලව පවරා ගෙන ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | කෙරීගෙන යන වැඩ ශේෂය තුළ රු. මිලියන 1,184 ක් වටිනා ව්‍යාපෘති 29 කින් දැනටමත් නිම කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ඉහත ව්‍යාපෘතිවලින් වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ද සිදුකල යුතු ගැලපීම් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශයේ කෙරීගෙන යන වැඩ ශේෂය තුල ඇතුලත්ව ඇති වැඩ නිම කල ව්‍යාපෘති හඳුනාගෙන ඒවා වැඩ නිමකල ව්‍යාපෘති ලෙස ගිණුම් ගත කිරීමටත් විධිමත්ව අදාල ආයතන වලට පවරා දීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ සඳහා අවශ්‍ය අමාත්‍යාංශ ඉංජිනේරුගේ නිර්දේශ ලබාගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බවද දැනුම් දෙමි. | නිම කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැලපීම් අමාත්‍යාංශය විසින් සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් වැය විෂයන් 20 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු. මිලියන 89 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරිකරගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 8 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ ප්‍රතිපාදනයෙන් මු.රෙ 66 මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයයන් වෙත මුළු ප්‍රතිපාදනයම හෝ ප්‍රතිපාදනයෙන් සියයට 50 – 100 දක්වා පරාසයකින් ප්‍රතිපාදන අඩුකර ගැනීමෙන් හා වැය විෂයයන් 12 කට අදාලව ඇස්තමේන්තු කර තිබූ ප්‍රතිපාදන සියයට 50-530 දක්වා පරාසයකින් වැඩි කර ගැනීමක් සිදුකර තිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අනුව කටයුතු කිරීම, ප්‍රතිපාදන වෙන් කිරීම් කළද වියදම් අවශ්‍යතා ඇති නොවීම, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වැනි හේතු මත ප්‍රතිපාදනය උපයෝජනය නොකර ඉතිරි වී වීම් හා මාරු කිරීම් සිදුකර ඇත. | නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය තුලදී ජාතික තරුණ සේවා සභාව වෙත ලබාදුන් රු. මිලියන 573 ක ප්‍රාග්ධන ප්‍රදානය සහ ජාතික තරුණ සේවා සභාවේ ගිණුම්ගත කර තිබූ වියදම් වටිනාකම අතර රු. මිලියන 6 ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි. | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2022 තරුණ කෘෂි සමාගම් හා කෘෂි ව්‍යවසාය ප්‍රවර්ධන කිරීමේ වැඩ සටහන සඳහා වියදම් දැරීමට 194-2-7-2-2201 වැය විෂය යටතේ අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ගිණුම්ගත කරනු ලැබූ රු.6,567,873 ක වියදම ජාතික තරුණ සේවා සභාවේ ගිණුම්වලට ඇතුලත්ව නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එය නිවැරදි කර ගන්නා ලෙස දැනුවත් කර ඇත. | රාජ්‍ය ආයතන වලට ලබාදෙන ප්‍රදානයන් එම ආයතනවල ගිණුම්ගත කිරීම පිළිබඳ අධීක්ෂණය කළ යුතුය. |

**2.2** තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ පැවති වර්ෂ 02 සිට 05 අතර හා වර්ෂ 05 ට වඩා පැරණි පිළිවෙලින් එකතුව රු. මිලියන 17 ක් හා රු. මිලියන 1.6 ක් වූ කොන්ත්‍රාත් තැන්පතු 14 ක් සම්බන්ධයෙන් තවදුරටත් බැඳීමක් තිබේද යන්න සොයාබලා අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි. | අදාල ව්‍යාපෘතියේ, ව්‍යාපෘති උපදේශක නිර්දේෂ සම්බන්ධයෙන් අදාල අංශ වෙතින් තොරතුරු කැඳවා ඇති අතර තොරතුරු ලද පසු තැන්පත් මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. | තැන්පතු සම්බන්ධයෙන් තවදුරටත් බැඳීමක් තිබේද යන්න සොයා බලා එපරිදි නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

**3.1.1** අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් කුරුණෑගල මලියදේව විද්‍යාලයේ දුනු පිටිය හා වෙඩි පිටිය මාස 06 ක් තුල නිම කිරීම සඳහා රු. මිලියන 12 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට 2018 මාර්තු 28 දිනැතිව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණු නමුත්, ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබුණි. එමෙන්ම, එකඟ වූ වටිනාකමට වඩා රු.4,225,610 ක බදු සහිත වටිනාකමක් අමතරව ගෙවා තිබුණු අතර එම ක්‍රීඩා පිටි භාවිතා කළ හැකි තත්ත්වයට මේ වෙන තෙක් පත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර කාර්යක්ෂමතාවයෙන් හා අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති සැලසුම් කල යුතුය. තවද ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය සහ නියාමනය සිදුකළ යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය ක්‍රීඩා ඇකඩමියක් හා අන්තර්ජාතික ක්‍රීඩාංගනයක් ලෙස සංවර්ධනය කිරීමට අදාලව 2017 සිට 2022 වර්ෂය දක්වා රු. මිලියන 3,866 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙනතිබුණු අතර, ඉන් රු.මිලියන 606 ක් පමණක් වියදම් කර තිබුණි. එම වියදමින් රු. මිලියන 487 ක් වැය කර ඉදිකර තිබූ මීටර් 400 කෘතිම ධාවන පථයේ ස්ථාන කිහිපයක පළුදු වී පැවතීම හා මන්තිරු වෙන් කරන ලද ඉරි මැකී ගොස් තිබීම හේතුවෙන් එම ධාවන | පිළිතුරු ලබා දී නොමැත. | ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමවත්ව කළමනාකරණය හා නියාමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පථයේ තරඟ සඳහා සහභාගී වන ක්‍රීඩකයන් අපහසුතාවට පත්වී ඉදිකිරීම් වල සැලකිය යුතු දුර්වලතා පැවතුනි. තවද මුළුතැන්ගෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදුකර ගැනීම සඳහා, ගිවිසුමක් නොමැතිව රු. මිලියන 5.4 ක අත්තිකාරම් මුදලක් රජයේ ඉදි කිරීමේ ආයතනයක් වෙත 2019 වර්ෂය තුල ගෙවා තිබුණද, අදාළ ඉදිකිරීම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ගෙවූ අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දින ටෙක්නොමෙඩික්ස් ඉන්ටර්නැෂනල් නැමැති පෞද්ගලික ආයතනය වෙතින් රු. මිලියන 249 ක මුදලකට මානව කාර්යසාධන විද්‍යාගාරය සඳහා උපකරණ සැපයීම, ස්ථාපනය කිරීම, පැවරීම, පුහුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා එම සමාගම හා ක්‍රීඩා වෛද්‍ය ආයතනය කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. අදාළ සමාගම විසින් 2023 ජනවාරි 23 හා 24 දින උපකරණ ස්ථාපනය පමණක් සිදු කර තිබුණු නමුත් පරීක්ෂණාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු 2021 නොවැම්බර් 16 දින සිට සති අටක කාලසීමාව තුළ ගිවිසුම්ගත පරිදි උපකරණ ස්ථාපිත කිරීම් සිදු කල යුතු වුවද සැපයුම්කරු මාස 13 ක ප්‍රමාදයකින් පසුව උපකරණ ස්ථාපනය කර තිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි 26.1 අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් එක් සතියකට සියයට 1 බැගින් උපරිම සියයට 10ක් එනම් රු. මිලියන 25 ක් අය කළ හැකි වුවද ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදුකර එම ප්‍රමාද ගාස්තුව අයකර ගැනීමටද අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | මානව කාර්යය සාධන විද්‍යාගාරයේ කටයුතු නිසිපරිදි කරගෙන යෑමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය අවශ්‍ය සෑම පියරවක්ම ලබාගෙන ඇති අතර ඉදිරියේදී ද අවශ්‍ය කටයුතු නොපිරිහෙලා ඉටු කිරීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය කටයුතු කරනු ලබයි.<br>ව්‍යාපෘතිය ප්‍රමාදවීමට අදාල පාර්ශවයේ කටයුතු වලින් පරිභාහිරව පාලනය කල නොහැකි කාරණාවන් මත සිදුවන බැවින් ප්‍රමාද ගාස්තු අය කිරීම සිදුනොකරන ලදී. | පිරිවැය ප්‍රතිලාභ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය. වැය කළ මුදලට ප්‍රතිලාභ ලබා ගැනීමට කඩිනමින් සැපයුම්කරු සමඟ සාකච්ඡා කළ යුතු අතර පිළිගත නොහැකි ප්‍රමාදයන් සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 34.5 ක් වන ඉඩමක ඉදිකිරීමට යෝජිතව තිබූ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සැලසුම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් එනම් රු. මිලියන 51 ක් ගෙවා තිබුණත්, 2021 වර්ෂයේදී ව්‍යාපෘතිය නවතා දැමීම හේතුවෙන් ඒ සඳහා වැය කළ මුළු වියදම නිෂ්කාර්ය වී | මුදල් අමාත්‍යතුමාගේ අමාත්‍ය මණ්ඩල සංදේශ අංක අමප/20/0822/204/080 හා 2020.06.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම හේතුවෙන් රටේ ණය බර වැඩි විය හැකි බැවින් ණය පහසුකම් ගාස්තු ලෙස යුරෝ 264,492.34 ක් ගෙවා තිබුණද මෙම ගිවිසුම අවලංගු කිරීම වඩා ප්‍රතිඵල දායක බව දන්වා ඇත. | ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටු කිරීම සඳහා සැලසුම් කළ යුතු අතර වන්දි ඉල්ලීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ප්‍රකාරව කටයුතු |

| | | |
|---|---|---|
| තිබුණි. ඊට අමතරව 2023 වර්ෂයේදී මෙම කොන්ත්‍රාත්කරු විසින් යුරෝ මිලියන 23 ක වන්දි මුදලක් ද ඉල්ලුම් කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් ඒ සඳහා නීතිපති උපදෙස් විමසා තිබුණි. | | කළ යුතුවීම. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා වෛද්‍ය ආයතනය සතුව විකිරණ ශිල්පියෙකු නොමැතිව, මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම මත පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් අනුමත නොකිරිම හේතුවෙන් රු. මිලියන 3 ක Mobile X Ray යන්ත්‍රයක්, රු. මිලියන 1.1 ක Radiation Protection Accessories Set උපකරණයක්, රු.මිලියන 4.3 ක X කිරණ මේස සහ X- Ray Digital Film Imaging System එකක් ඇතුළත්ව රු. මිලියන 1.6 ක් වැය කර සකස් කරන ලද X කිරණ කාමරය , මිලදී ගත් දින සිට පිළිවෙලින් වර්ෂ 07ක් , වර්ෂ 06 ක් සහ වර්ෂ 02 කට වැඩි කාලයක් උපයෝජනය නොකොට නිශ්කාර්යව පැවතුණි. | ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ විකිරණ අංශයක් ස්ථාපිත කිරීමේ අරමුණින් 2016 වර්ෂයේදී X-කිරණ යන්ත්‍රයක් මිලදී ගැනීමට සමගාමීවම විකිරණ ශිල්පියෙකු බඳවා ගැනීම් සඳහා ද කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කරන ලදී. නමුත් ආයතනයේ තනතුරු කිහිපයක් යටපත් කිරීමෙන් අනතුරුව 2023/08/31 දිනැතිව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් විකිරණ ශිල්පී තනතුර ඇතුලුව තවත් තනතුරු 03 ක් අනුමත කරන ලදී.<br><br>එම අනුමැතිය සමග බඳවා ගැනීම් පටිපාටි සකසා ඉදිරි බඳවාගැනීම් සිදුකරන ලෙස ලබා දෙන ලද උපදෙස් පරිදි බඳවා ගැනිමේ පටිපාටියක් සකසා ඉදිරි කටයුතු වෙනුවෙන් 2023/12/14 දින යටිතල පහසුකම් සංවර්ධන අංශය වෙත යොමු කරන ලදී. | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වත්කම් මිලදී ගත යුතු අතර මිලදී ගත් උපකරණ උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |

**3.4 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු සහිත අවස්ථා නිරාකරණය වන ලෙස 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීමේ හා යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | පවතින ක්‍රීඩා පනත සංශෝධනය සඳහා ක්‍රීඩා, තාක්ෂණ, නීති හා විවිධ ක්ෂේත්‍රවල දැනුමැති කමිටුවක් පත් කළ අතර එම කමිටුව මඟින් මේ පිළිබඳ අදාළ ආයතන හා විවිධ පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව සංශෝධිත ක්‍රීඩා පනත් කෙටුම්පතක් සකස් කර ඇත. අදාළ කෙටුම්පත ඉදිරි කටයුතු සඳහා 2023.11.29 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත. | ක්‍රීඩා පනත කඩිනමින් සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සියලුම ජාතික ක්‍රීඩා සංගම් හා ඊට අයත් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ කුසලතා ආකල්ප සංවර්ධනය කර ඔවුන් සඳහා පුහුණුකරු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම ක්‍රීඩා විද්‍යා ආයතනයේ ප්‍රධාන කාර්යයක් වුවත්, විගණිත දින වන විට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංගම් 66 කින් විවිධ ක්‍රීඩා සංගම් 21 කට අදාළ පුහුණුකරුවන් 2,067ක් වෙත පමණක් ලියාපදිංචි සහතික නිකුත් කර තිබුණි. ඉතිරි ක්‍රීඩා සංගම් 45 හි පුහුණුකරුවන් ක්‍රීඩා විද්‍යා ආයතනයේ ලියාපදිංචි වී නොතිබුණ ද, ඔවුන් විසින්ද ක්‍රීඩා පුහුණු කිරීම් කටයුතු සිදු කරනු ලබන අතර, ක්‍රීඩා විද්‍යා ආයතනයේ පුහුණුකරු ලියාපදිංචි සහතිකය ලබා නොගත් පුහුණුකරුවන්ට තම පුහුණු කිරීම් කටයුතු සිදුකළ නොහැකි බවට හා ක්‍රීඩා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වගකීම මෙන්ම නෛතික බලතලද, ක්‍රීඩා විද්‍යා ආයතනයට ලබා ගැනීමට අවශ්‍යවන නෛතික සංශෝධනයන් සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය මඟින් සිදුකර නොතිබුණි. | ප්‍රධාන ක්‍රීඩාවන්හි පුහුණුකරුවන් ලියාපදිංචි කර ඔවුන් වෙත පුහුණුකරු ලියාපදිංචි සහතිකද නිකුත් කර එම සහතික වසර දෙකකට වරක් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | පුහුණුකරුවන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය නෛතික බලය ක්‍රීඩා විද්‍යායතනයට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී රු.199,460 ක ආපදා ණය ශේෂයක් සහ රු.8,750 ක උත්සව අත්තිකාරම් ණය ශේෂයක් හිමි සේවකයෙකු සහ රු.129,855 ක අපදා ණය ශේෂයක් හිමි තවත් සේවකයකු සේවය අතහැර ගොස් සිටි අතර, ඔවුන්ගෙන් අයකර ගත යුතු ආපදා ණය ශේෂයන් හා උත්සව අත්තිකාරම් ශේෂයන් අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. ඊට අමතරව රු.26,567 ක තවත් ණය ශේෂයක් වර්ෂ 05 සිට 10 දක්වා වූ කාල පරාසයක සිටම අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | ණය අයකර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. | ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ණය මුදල් අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයයේ විදුලි ජනන යන්ත්‍ර කාමර ව්‍යාපෘතිය සඳහා ලබා දුන් වැඩ අත්තිකාරම් මුදලින් රු.මිලියන 15 ක්ද, මුළුතැන්ගෙය සහ ආපනශාලා ගොඩනැගිල්ලේ නවීකරණය | පිළිතුරු ලබා දී නොමැත. | අත්තිකාරම් මුදල් විධිමත්ව හා අප්‍රමාදව නිරවුල් කරගත යුතුවේ. |

කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 5 ක්ද සහ කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලීය ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා ලබා දුන් වැඩ අත්තිකාරම් රු. මිලියන 6 ක්ද අය කර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා අමාත්‍යාංශයේ සහ එයට අයත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය,නායකත්ව ජාතික මධ්‍යස්ථානය,ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය,ක්‍රීඩා වෛද්‍ය ආයතනය හා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 30 ක් ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 51 ක්ද, ද්විතික මට්ටමේ පුරප්පාඩු 116 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 53 ක් ඇතුළු මුළු පුරප්පාඩු සංඛ්‍යාව 253 ක් පැවතුණි. මෙම පුරප්පාඩු තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය කෙරෙහි බෙහෙවින් වැදගත්වන කාර්යමණ්ඩල ඌනතාවයන් පැවති අතර එයට අමතරව නායකත්ව සංවර්ධන ජාතික මධස්ථානයේ පුහුණු හා පර්යේෂණ සහකාර/සංවර්ධන තනතුරු 11ක් සහ කාර්යාල සහායක සේවයේ තනතුරු 2ක් අතිරික්තව පැවතුණි. | පවතින ප්‍රතිපත්තිමය තීරණ මත බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇත. අනෙකුත් ඒකාබද්ධ සේවයේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් අවශ්‍ය පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලුම් කර ඇත.නව බඳවාගැනීම් 2024 වර්ෂයේ බඳවා ගන්නා ලදි | අවශ්‍යතා සැලකිල්ලට ගෙන හිග කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |